**අලව්ව ප්‍රාදේශීය සභාව - 2020**

**--------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**-------------------------------**

අලව්ව ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට අලව්ව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) ප්‍රාදේශීය සභාවේ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි 16 ක් සංවර්ධනයට දරා තිබූ රු.10,968,377 වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2021 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම්ගත කිරීමටත් කටයුතු කරන බව දන්වමි. | ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධන වියදම් ප්‍රාග්ධනිත කළ යුතුවේ. |
| (ආ) | 1996 හා 2011 වසරවල ඉඩම් වෙන්දේසිවලින් ලැබී තිබුණු රූඩ් 3 පර්චස් 31.3 ක් වූ ඉඩම් 02 ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2021 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වමි. | ඉඩම් හඳුනාගෙන ගිණුම් තැබීම කළ යුතුවේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාළ මුද්දර ගාස්තුව රු. 21,910,000 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබූ අතර, ලැබිය යුතු මුද්දර ගාස්තු ගිණුම්ගතකර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී ගිණුම් තැබීමට කටයුතු කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුවේ. |

**1.6.2 අසම්භාව්‍ය බැරකම්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවට එරෙහිව බාහිර පාර්ශවයන් 04 ක් සඳහා කුඹුරු ඉඩම් ගොඩ කිරීම හා ඉඩම් අයිතිය සම්බන්ධයෙන් නඩු පවරා තිබූ අතර, එම නඩු සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබූ අතර මේ සඳහා සභා අරමුදලින් රු.143,480 ක් ගෙවා තිබුණි. | නොවිසඳී ඇති නඩු සම්බන්ධයෙන් හෙළිදරව් කිරීම ඉදිරි මූල්‍ය ප්‍රකාශනවල සිදුකිරීමට කටයුතු කරන බව දන්වමි. | අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 8,521,360 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 6,520,211 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.1,009,679 ක වරිපනම් හා බදු මුදලක් තවදුරටත් අය වීමට පැවතුණි. | රට පුරා පැවති කොරෝනා වසංගත තත්ත්වය මත හිඟ ආදායම් එක්රැස් කිරීමේ වැඩසටහන් සාර්ථකව ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | හිඟ ආදායම් කාලීනව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2020 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 2,189,000 ක් හා මුද්දර ගාස්තු රු.37,064,300 ක් විය. | කඩිනමින් ලබා ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | අදාල මුදල් සභාවට ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුවේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳව කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳ නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු කර්මාන්ත ණයහිමි, විශ්‍රාම වැටුප් හා තැන්පතු ශේෂවල එකතු වටිනාකම රු.29,440,490 ක් විය. ඒ පිළිබඳ කාල විශ්ලේෂණයට අනුව වසර 1 සිට 5 දක්වා කාලයට අදාළ ගිණුම් ශේෂ එකතුව රු.1,646,683 ක් වූ අතර වසර 5 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.6,605,439 ක් වී තිබුණි. | තවදුරටත් ගෙවිය යුතු ශේෂ ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ විශේෂ අවශ්‍යතා සහිත ගම්මාන නගාසිටුවීමේ වැඩසටහන යටතේ මාරගල්කන්ද ගම්මානය සඳහා පානීය ජල ව්‍යාපෘතියක් ඉදිකිරීම සඳහා රු. 5,041,154 ක් වැය කර තිබුණි. මෙම ව්‍යාපෘතිය මඟින් 2018 වර්ෂයේ ඔක්තෝබර් මාසය වන විට ප්‍රදේශයේ පදිංචි පවුල් 125 කට ජලය සැපයීමට හැකි බවට ඉලක්ක කර තිබූ නමුත්, 2020 අගෝස්තු 15 දින වන විට ව්‍යාපෘති ආරම්භ කර වසර 02 කට ආසන්න කාලයක් ගතව තිබුණද, ප්‍රදේශයේ ජනතාවට ජලය ලබා දීමට කටයුතු කර නොතිබුණි.රු. 324,000 ක් වැය කර සවිකර තිබුණු ජල මෝටරයේ හා රු.231,000 ක් වූ ලීටර් 10,000 ජල ගබඩා ටැංකි 02 හි වගකීම් කාලය වසර 02 ක් භාවිතයෙන් තොරවම ගතවී ගොස් තිබුණි. | නල එළිමේ ව්‍යාපෘතියට රු.3,200,000ක ප්‍රතිපාදනයක් ලබාදීමට 2021 වසර සඳහා මුදල් කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇති බැවින් මෙම වසර තුළ එම ව්‍යාපෘතියේ කටයුතු අවසන් කළ හැකි බව දන්වමි. ප්‍රදේශවාසින් එක්ව ජල කමිටුවක් පිහිටුවා දැනට සවි කර ඇති ජල මෝටරය භාවිතා කර ජල ගබඩා ටැංකි ජලයෙන් පුරවා ටැංකි ආසන්නයෙන් බෙදා හැරීම් කරාමයක් සවි කර එම ළිඳේ ජලය ප්‍රයෝජනයට ගනු ලබයි. | ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිලාභ මහජනතාවට ලබාදීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | 2018 වර්ෂයේ වයඹ සංවර්ධන ප්‍රතිපාදන යටතේ වැවල මැල්ල කන්ද මාර්ගය කැටගල් අල්ලා සංවර්ධනය කිරීම සඳහා රු. 8,393,022 මුදලක් ගෙවීම් කර තිබුණි. මාර්ගය භෞතිකව පරීක්ෂාවේදී වර්ග මීටර් 2,672.33 ප්‍රමාණයක් සහිත අදාළ මාර්ගයේ පැතිබැම්ම ඉදිකර තිබුණු ස්ථානයේ වර්ග මීටර් 18 ක 20 (.8+9+1/3) පමණ ප්‍රදේශයක් ගිලා බැස පැත්තකට නෙරා ගොස් තිබුණි. | මෙහි ගිලා බැසීමට ලක් වූ කොටස ඉදි කරන අවස්ථාවේදීද මාර්ගය විශාල වශයෙන් කැඩී ගිය ස්ථානයකි. එයට හේතුව එක් පැත්තකින් වැවක් පිහිටා තිබීම නිසා මෙම මාර්ගය වැව් බන්ට් එකක් ලෙසද භාවිතා වේ. එහිදී වැවේ වතුර පිරී ඇති අවස්ථාවලදී මාර්ගයට තෙතමනය කාන්දු වීම වැලැක්විය නොහැක. | ඉදිකිරීම් සිදු කිරීමේදී නියමිත ප්‍රමිතියට ඉදිකිරීම් සිදුකළ යුතු වේ. |